ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය අනුව තොග ශේෂයේ වටිනාකම රු.මිලියන 164.90 ක් වූ අතර එහි ඇතුලත් පුහුණු උපකරණ, ප්‍රධාන තොග වලින් වෙන්කර හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද තොග ලැබීම් හා නිකුත් කිරීම් කළමනාකරණය සඳහා විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර නොමැති හෙයින් යල්පැන ගිය සෙමින් චලනය වන හා චලනය නොවන තොග හඳුනාගැනීමටද නොහැකි වූ බැවින් මෙම තොග වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 9 හි 15 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන ඇතුළුව තොග තක්සේරුවේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට පියවර ගනු ලැබේ.	විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 13 ඡේදයට පටහැනිව ඉදිකිරීම් උපකරණ, පුහුණු මධ්‍යස්ථානය සතු රු. මිලියන 12.15 ක් වටිනා පුහුණු උපකරණ, තොග ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.	මූලික වශයෙන් පුහුණු පාඨමාලා සපයන අධ්‍යාපන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බැවින්, අදාළ වත්කම්වල වටිනාකම රු.මිලියන 12.67 මෙම කාණ්ඩයට අයත් වේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 වර්ෂයේදී රු. මිලියන 1.21 ක් වැය කර ඉදිකිරීම් ආරම්භ කරන ලද Well Water Plant ප්‍රාග්ධන ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ නමුත් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.	එම පිරිවැය නිමි කාර්යය ප්‍රමාණයෙන් ගොඩනැගිලි සහ සවිකිරීම් වලට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.	මේ වන විට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බැවින් ප්‍රාග්ධනිත කළ යුතුය.
(ආ)	වැට් බදු සඳහා ප්‍රකාශිත ආදායම රු. මිලියන 200.85 ක් වන අතර මූල්‍ය ප්‍රකාශන අනුව වැට් බදු සඳහා පදනම් විය යුතු ආදායම රු. මිලියන 207.37 ක් වන බැවින් රු. මිලියන 6.52 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම වෙනසට හේතුව, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට අනුව වැට් බදු නිදහස් කිරීම් යටතට වැටෙන අධ්‍යාපන සේවාවලින් ලැබෙන ආදායමයි.	වෙනස සැසඳීම සඳහා සැසඳුම් ප්‍රකාශයක් සකස් කළ යුතුයි.
(ඇ)	අධිකාරිය විසින් බත්තරමුල්ල ප්‍රදේශයෙහි පවත්වාගෙන යනු ලබන ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් තුළ පිහිටුවා තිබුණු අතර, මෙම ඉඩම සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුමකට එළඹීම සඳහා රු. මිලියන 54.89 ක් හා සියයට 07 ක ප්‍රමාද පොළියක් ලබාදෙන ලෙස 2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දින තෙක් අධිකාරිය විධිමත් ගිවිසුමකට එළඹීමට සහ මෙම ගෙවිය යුතු මුදල් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ඉඩම දීර්ඝකාලීන බදු පදනමින් අප ආයතනයට පවරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය (UDA) වෙත රේඛීය අමාත්‍යාංශය හරහා ඉල්ලීමක් කර ඇත. ඉහත දීර්ඝකාලීන බද්දට අදාළව ගෙවිය යුතු බදු මුදල හා ඒ මත වූ පොලිය අඩුකර දෙන ලෙස රේඛීය අමාත්‍යාංශය හරහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීමක් කර ඇත.	මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් වර්ෂය අවසානයේ දී අධිකාරියේ විවිධ ණයහිමියන්ගේ වටිනාකම රු.මිලියන 4.44 ක් වූ අතර ඉන් රු.මිලියන 3.29 ක	මෙම විවිධ ණයහිමියන් තුල නිරාකරණය නොවූ සේවක අවසාන වැටුප් ගෙවීම් සහ අර්ථසාධක මුදල් මෙන්ම විවිධ ආයතනික අවශ්‍යතා මත	ණයහිමි ශේෂයන් කාලීනව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

ශේෂයන් වසර දහයකට අධික කාලයක් සිට නිරවුල් නොවී පැවතුණි.	අවස්ථානුකූලව පැන නගින ලද, එහෙත් මේ වන තෙක් නිරවුල් නොවූ වටිනාකම් ඇතුලත් වේ.

1.6.2 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 වර්ෂයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු රු.මිලියන 0.24 ක අත්තිකාරම් ශේෂයක් අය කර ගෙන නොතිබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දක්වා නොමැත.	අදාළ කාර්යය ඉටු කර ගැනීමට හෝ අත්තිකාරම් මුදල් ආපසු ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මුදල් රෙගුලාසි 71 (i) ඒ	අධිකාරිය විසින් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 6.05 ක දිරිදීමනා ගෙවා තිබුණි.	නියමිත අනුමැතින් ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	නියමිත අනුමැතින් ලබා ගැනීමෙන් පසුව දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 371 (2) (ඇ)	විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 0.13 ක් වටිනා අත්තිකාරම් මුදල් හා රු.මිලියන 2.06 ක පුහුණු අත්තිකාරම් මුදල් නිරවුල්කර නොතිබුණි.	ඉදිරියේදී එම අත්තිකාරම් පියවීමට කටයුතු කරනු ලැබේ.	අත්තිකාරම් මුදල් කඩිනමින් නිරවුල් කරවා ගැනීමට ක්‍රමවේදයන් හඳුන්වාදිය යුතුය.
(iii)	මු.රෙ 104 (3) හා (4)	2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සිදු වූ හදිසි අනතුරු 12 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා විගණිත දිනය දක්වා සකස් කර නොතිබුණි.	පිලිගනිමි. ඉදිරියේදි මේවා නිවැරදිව වාර්තා කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	මු.රෙ. ප්‍රකාරව ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා සකස් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015	නිළධාරීන් තිදෙනකු විසින් 2019, 2020 හා 2021 වර්ෂවල අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ඉන්ධන භාවිතාකර තිබුණු අතර ඒ සඳහා අධිකාරිය විසින් වැඩිපුර වැය කරන ලද රු.මිලියන 1.19 ක මුදල මෙතෙක් අයකරගෙන නොතිබුණි.	වාහන අනුයුක්ත කිරීම සහ මාසික ඉන්ධන දීමනාව වැටුපට එකතු කොට ගෙවීම ක්‍රියාත්මක කර ඇත්තේ 2022.03.01 දින සිටය. එතෙක් එම වාහන සඳහා ඉන්ධන සැපයීම සංචිත වාහනවලට සපයන ආකාරයට ඇණවුම් ක්‍රමයට ආයතනයෙන් සපයා ඇති අතර අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් විසින් භාවිතා කරන ලද වාහන සංචිත වාහන මෙන් පොදු රාජකාරී සඳහා ද යොදා ගැනීම සහ දෛනික ධාවන සටහන් ලිවීම සිදු වී ඇත. ආයතනයේ සභාපතිවරයා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා වෙත අනුයුක්ත කර තිබූ වාහන දෙක සඳහා ද ඉන්ධන සපයා ඇත්තේ මේ ආකාරයටමය. කෙසේ වුව ද, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වූ 2015.06.01 දින සිට 2018.12.31 දක්වා කාලයේදී ද එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව ක්‍රියාකර නොතිබුණි.	ඉන්ධන සීමාව තුළ ඉන්ධන භාවිතා කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මු.රෙ.756 (6)	එක් මූල්‍ය වර්ෂයක් අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ජංගම නොවන වත්කම් සහ තොග අයිතමවල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම අවසන් සමීක්ෂණ වාර්තා ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.	අධිකාරියට අයත් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ ඉතිරි තොගයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර එම කාර්යය කඩිනමින් ඉටුකිරීමට කටයුතු කරනු ලැබේ.	සියලුම භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණය සිදුකර එම අවසන් සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	2020 ජනවාරි 27 දිනැති අංක PED/01/2020 දරන මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති	එක් එක් සේවාව සඳහා ගත වන කාලයන් සහ ගාස්තු දක්වමින් පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර කාර්යාල පරිශ්‍රවල සහ වෙබ් අඩවිවල	පුරවැසි ප්‍රඥප්තිය 2023.11.22 දින සිට ආයතනයේ වෙබ් අඩවියේ පළකර ඇති අතර ඒ සමගම එහි දෘඩ පිටපතක් ආයතනයේ පිළිගැනීම් කවුළුවේ සහ තොරතුරු මධ්‍යස්ථානයේ	චක්‍රලේඛය ප්‍රකාර අවශ්‍ය සියලු තොරතුරු ඇතුලත් පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය.

	සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 06 ඡේදය	මහජනතාවට/ පාරිභෝගිකයින්ට ප්‍රදර්ශනය කළ යුතුය. කෙසේ වුවද, අධිකාරිය විසින් 2024 අප්‍රේල් 05 දින වන විටත් මෙම චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	(Information Centre) මහජනයාගේ ප්‍රදර්ශනයට තබා ඇත.	
(ඉ)	කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාගේ 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 10/2022 හා 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	ධාවන තත්ත්වයේ නොතිබෙන හා අළුත්වැඩියා කොට භාවිතයට ගැනීම සුදුසු නොවන වාහන අපහරණය කළයුතු වුවද පිරිවැය රු.මිලියන 3.10 ක් වන වාහන 03 ක් වන අංක GB – 9123, 61-4630 හා 61-4631 දරණ වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	GB – 9123 වාහනය විකිණීම සඳහා 2019 වර්ෂයේ දී කටයුතු කර ඇතත් එම අවස්ථාවේ දී ගැණුම්කරුවන් ඉදිරිපත් වී නොතිබුණි. අංක 61 – 4630 හා 61 – 4631 වාහන දෙකෙහි අයිතිය නොමැති හෙයින් ඒවායේ අයිතිය පවරා දෙන ලෙස අංක 1/4/1/17/2 දරණ 2023.09.22 දිනැති ලිපියෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇත.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 38 වන අතිරේකය			
(i)	2.14.1 ඡේදය	රුපියල් ලක්ෂ 5 ඉක්මවන අළුත්වැඩියා වියදම් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.	අලුත්වැඩියාවන් රු.මිලියන 0.5 ඉක්මවන විට CAO ගේ පුද්ගලික අනුමැතිය නිසි ලෙස මාර්ගෝපදේශයට අනුව ලබා ගැනේ.	රු. ලක්ෂ 05 ඉක්මවන සියලුම අළුත්වැඩියා වියදම් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතුය.
(ii)	5.4.8 (ආ)	කාර්යය සාධන සුරක්ෂණය වැඩ නිමකිරීමට අපේක්ෂිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතු වුවත් සව්සිරිපාය ගොඩනැගිල්ලේ වහල අළුත්වැඩියා කටයුතු නිමකිරීම 2023 ජූනි 27 දින දක්වා ප්‍රමාදවී තිබුනද ලබාගෙන තිබුණු කාර්යයසාධන	ඉදිකිරීම් සඳහා අමතර වැඩ කොටස් කිරීමට කොන්ත්‍රාත්කරුට පැවරූ බැවින් ඒ සඳහා කාලය ගතවීම හේතුවෙන් අපේක්ෂිත දිනයට වඩා දින 27කින් වෙනස් වූ බව පිළිගනිමි.	කාර්යය සාධන සුරක්ෂණය වැඩ නිමකිරීමට අපේක්ෂිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතුය.

සුරක්ෂණයේ කාලය දීර්ඝ කරගැනීමට කටයුතු කර නොතිබුණි.

1.8 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි සාමාන්‍ය වශයෙන් රු.මිලියන 242.70 ක මුදල් ශේෂයක් පසුගිය වර්ෂ 05 කට අධික කාලයක් තුල පවත්වාගෙන ගොස් තිබුණු අතර අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ඇති අතිරික්ත මුදල් උපායමාර්ගිකව කෙටිකාලීන ආයෝජනවල යෙදීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම මේ හේතුවෙන් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.	ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා අතිරික්ත අරමුදල් කළමනාකරණය කිරීමේ වැදගත්කම අපි හඳුනා ගනිමු.	අතිරික්ත මුදල් උපායමාර්ගිකව කළමනාකරණය කර කෙටිකාලීන ආයෝජන ක්‍රමවල යොදවා ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 26.88 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 43.15 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 70.03 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වසරට සාපේක්ෂව NVQ පුහුණු පාඨමාලා ආදායම ඉහළ යාම, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි ආදායම ඉහළ යාම, පුහුණු පාඨමාලා ආදායම සහ ස්ථිර තැන්පතු පොළී ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විස්තරය	ප්‍රවර්ථන වර්ෂයේ ශේෂය (රු)	ඉකුත් වර්ෂයේ ශේෂය (රු)	වෙනස හිතකර/(අහිතකර) (රු)	වෙනස (%)
ආදායම්				
ලියාපදිංචි ආදායම්	160,922,440	139,858,225	21,064,215	15
පුහුණු පාඨමාලා ආදායම්	32,872,385	25,162,899	7,709,486	31
යන්ත්‍ර සූත්‍ර කුළී ආදායම්	2,194,502	1,058,460	1,136,042	107
ප්‍රකාශණ අලෙවිය	5,308,202	3,738,821	1,569,381	42
සම්මන්ත්‍රණ ගාස්තු	8,779,978	5,729,100	3,050,878	53
පොළී ආදායම් (ස්ථිර තැන්පතු)	31,153,373	15,069,798	16,083,575	107
ශ්‍රවනාගාරය සහ සම්මන්ත්‍රණ ශාලා කුළී ආදායම්	10,422,990	6,483,941	3,939,049	61
NVQ පුහුණු පාඨමාලා ආදායම්	55,863,603	12,233,000	43,630,603	357

වියදම්				
ඉන්ධන දීමනා	3,339,524	3,227,366	(112,158)	(3)
ප්‍රසාද දීමනා ගෙවීම්	6,048,836	5,770,144	(278,692)	(5)
කාර්යාල උපකරණ නඩත්තු	4,346,772	3,720,280	(626,492)	(17)
වාහන නඩත්තු	7,288,045	4,033,805	(3,254,240)	(81)
යන්ත්‍ර උපකරණ නඩත්තු	1,811,908	165,780	(1,646,128)	(993)

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් අඩු වී යාමට පටන් ගැනීම හේතුවෙන් අධිකාරියේ ප්‍රධාන ආදායම් වූ කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි ආදායම් සියයට 15 කින්, යන්ත්‍ර සූත්‍ර කුළියට දීමේ ආදායම් සියයට 107 ක් හා ප්‍රකාශණ අලෙවි ආදායම් සියයට 42 ක් ද සමාලෝචිත වර්ෂය තුළදී වැඩි වී තිබුණි.

(ආ) තවද පුහුණු පාඨමාලා ආදායම් හා පොළී ආදායම්වලද සැලකිය යුතු වර්ධනයක් විගණනයේ දී සමස්ථයක් වශයෙන් නිරීක්ෂණය විය.

(ඇ) කාර්යාල උපකරණ, වාහන සහ යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම් සමාලෝචිත වර්ෂයේ දී සමස්තයක් වශයෙන් සියයට 70 කින් වැඩි වී තිබුණු බවද නිරීක්ෂණය විය.

2.3 අනුපාත විශ්ලේෂණය

අනුපාතය	**වර්ෂය**	
	2023	**2022**
ද්‍රවශීලතා අනුපාත	**වාර ගණන**	**වාර ගණන**
ජංගම අනුපාතය	3.20:1	2.75: 1
ක්ෂණික අනුපාතය	2.39:1	2.11: 1
ලාභ අනුපාත	**සියයට**	**සියයට**
වත්කම් මත ප්‍රතිලාභ	2.08	(3.17)

අධිකාරියේ සමාලෝචිත වර්ෂය තුළදී ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය වැඩි වී තිබුණි. රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් යහපත් වීමට පටන් ගැනීම හේතුවෙන් අධිකාරියේ ආදායම් වැඩිවීම මත ලාභදායකත්වය වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල ටවර් හෝල් රඟහල පදනමට අයත් වූ අතර රු.මිලියන 6.00 ක බදුකුලියකට 30 අවුරුදු බදු ගිවිසුමකට 1986 වර්ෂයේදී එළඹ තිබුණි. එම බදු ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු 2016 වසරේ සිට	මේ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ තීරණ අනුව ගරු නීතිපතිතුමාගේ මතය විමසා ඇති අතර එහි දී මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට යොමුකර තීරණයක් ගැනීමට උපදෙස් ලැබී ඇත. එම උපදෙස් ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල	ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය.

	නැවත අවුරුදු 30 ක කාලයක් සඳහා ඉඩම භාවිතා කිරීමට බදුකුලිය නැවත තක්සේරු කිරීමකින් තොරව 2019 වර්ෂයේ දී නව බදු ගිවිසුමකට එළඹ තිබුණි. අග්‍රාමාත්‍ය ලේකම් විසින් 2023 දෙසැම්බර් 07 දිනැති ලිපියක් මඟින් පැවති කුලී වටිනාකමටම ඇතිකර ගත් මෙම අවිධිමත් හා පාලක මණ්ඩල අනුමැතිය නොලද බදු ගිවිසුම අවලංගු කර රජයේ තක්සේරුකරුගේ තක්සේරු කුලී වටිනාකමට අනුව නව ගිවිසුමකට එළඹීමට හෝ සවිසිරිපාය පරිශ්‍රයෙන් ඉවත්ව අධිකාරියට අයත් බත්තරමුල්ල ප්‍රදේශයේ පවත්නා ගොඩනැගිලි සංකීර්ණයේ කාර්යාල පරිශ්‍රය ප්‍රතිස්ථාපනය කිරීමට පියවර ගන්නා ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2023 දෙසැම්බර් 19 දිනැති අංක MUDH/HC/AD/178/7 දරණ ලිපිය මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් බත්තරමුල්ල අධිකාරියට අයත් ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල වෙත අධිකාරිය ස්ථානගත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා තිබුණි. ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල සහිත ඉඩම සම්බන්ධයෙන්ද විධිමත් බදු ගිවිසුමක් නොමැති බැවින් ගිවිසුමකට එළඹීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද නොමැති බැවින් මෙම තත්ත්වය නිරවුල් කර නොගෙන මෙම ස්ථානයේ අධිකාරිය ස්ථාපිත කිරීම මතභේදාත්මක තත්ත්වයක් බව නිරීක්ෂණය විය.	පත්‍රිකාවක් කෙටුම්පත් කර රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකිරීමට අධිකාරියේ නීති අංශය විසින් කටයුතු කර ඇත.	
(ආ)	ගල්කුලම පිහිටි අධිකාරියේ මෙහෙයුම් ශිල්පී පුහුණු පාසල (OTC) හා කතරගම සංචාරක බංගලාව පිහිටි ඉඩම් සඳහා මෙතෙක් නිශ්චිත බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි.	මෙහෙයුම් ශිල්පී පුහුණු විදුහල (OTC) පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර මෙම ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත අප ආයතනය වෙත පවරන ලෙස තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීමක් කර ඇත. කතරගම සංචාරක බංගලාව පිහිටි ඉඩම නාමික බදු කුලියක් යටතේ අප ආයතනය වෙත දීර්ඝකාලීන බදු	බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය.

		පදනමින් පවරන බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දී ඇත.	
(ඇ)	ගල්කුලම මෙහෙයුම් ශිල්පී පුහුණු පාසලෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2019, 2020 සහ 2021 වර්ෂවලදී ලබා දී තිබුණු මුදලින් පිළිවෙළින් රු.මිලියන 2.84, රු.මිලියන 4.91 හා රු.මිලියන 0.30 ක මුදල් ද මෘදුකාංග සංවර්ධනය සඳහා 2022 වර්ෂයේදී ලබාදී තිබුණු රු.මිලියන 1.33 ක්, ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම සඳහා 2020 වර්ෂයේදී ලබාදී තිබුණු මුදලින් රු.මිලියන 13.82 ක මුදලක් විගණිත දින වන විටත් අරමුණුගත කාර්යය වෙනුවෙන් යොදානොගෙන ඉතිරිව පැවතිනි.	ව්‍යාපෘති යෝජනාවේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉතිරි වූ හා අසම්පූර්ණ වැඩ කොටස් නිසි ලෙස නිම කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.	අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට හෝ ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	අධිකාරියේ කාර්යන් දීප ව්‍යාප්තව කරගෙන යාම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාර්යාල 15 ක් ක්‍රියාත්මක වන අතර 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැළැස්මට අනුව එම කාර්යාලයන්හි ළඟාකර ගත යුතු ඉලක්කයන්, ළඟාකර ගත යුතු කාලය සහ කාර්යය සාධන දර්ශකයන් නිශ්චිතව දක්වා නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලයන්හි කාර්යයසාධනය පරීක්ෂාකිරීමට නොහැකි විය. 2023 වර්ෂයේ දී අධිකාරියෙහි කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාර්යාලයෙහි කාර්යය සාධනය පරීක්ෂාවට ලක්කල අතර 2023 වර්ෂයේදී කාර්යය සාධනය අඩු මට්ටමක පැවතුණි. තවද මෙම ප්‍රාදේශීය කාර්යාල මගින් සිදුකරන සියළු කාර්යයන් මාර්ගගතව සිදුකිරීමට හැකියාව පවතින බවට විගණයේදී නිරීක්ෂණය වූ අතර මේ සඳහා මෙතෙක් අධිකාරිය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා මසකට කල යුතු ඉලක්කය ලබා දී ඇත. මෙම නිලධාරීන් ආයතනයේ ප්‍රධාන අංශ තුන වන සංවර්ධන, කර්මාන්ත සේවා හා කර්මාන්ත පුහුණු යටතේ ඒ ඒ අදාල කාර්යයන් වල නිරත වේ. එම කාර්යයන්ට අදාල මාසික ප්‍රගතිය මාසිකව ගූගල් පත්‍රයක යාවත්කාලීන කරනු ලබන අතර අවශ්‍ය ඕනෑම විටකදී සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ ප්‍රගතිය ඒ හරහා නිරීක්ෂණය කල හැක.	ප්‍රාදේශීය කාර්යාලයන් හි කාර්යයසාධනය කාලීනව පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		

(i)	පනතේ Vවන කොටසෙහි 33 (i) වගන්තියට අනුව කිසියම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක සුදුසුකම් ලත් පුද්ගලයකු ලෙස විදේශීය උපදේශකයකු සම්බන්ධ කරගැනීමට අවශ්‍ය යම් තැනැත්තකු තාවකාලික ලියාපදිංචිය සඳහා අධිකාරිය වෙත අයදුම් කළ යුතු අතර එහි දෙවන වගන්තිය පරිදි සැම විදේශීය උපදේශකවරයෙකුම ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුතු වීමට පෙර අධිකාරියේ ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචිවීමේ ක්‍රියා පටිපාටි නියම කරනු ලබන පරිදි විය යුතුය. තවද 3 වන වගන්ති පරිදි එසේ ලියාපදිංචි නොවී වැඩකටයුතු සිදුකරන තැනැත්තකු මෙම පනත යටතේ වරදකරුවකු වන්නේය. මේ අනුව මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් මෙතෙක් ක්‍රියාකර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සාභාධිපත්‍ය කමිටුව මගින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කිරීමෙන් පසුව 2023 මැයි මසදී නීති කෙටුම්පත් සම්පාදකට යොමුකර ඇත. මේ වන තුරු නීති කෙටුම්පත් සම්පාදක සම්බන්ධ කරගත් නමුත් මෙය තවමත් සම්පාදනය කර නැත.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.
(ii)	පනතේ 43 වන වගන්තිය පරිදි අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනකරුවන්, නිෂ්පාදකයන් හා උපාංග සපයන්නන්ගේ නාමාවලියක් අධිකාරිය විසින් පවත්වාගෙන යායුතුය. පනතේ 44 වන වගන්තිය පරිදි අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට දැනට තිබෙන බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල නාමාවලියක් පවත්වාගෙන යා යුතුය. ඉහත නාමාවලීන් කාර්යාල වේලාවන්හිදී ගෙවීමකින් තොරව යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ලබාගතහැකි විය යුතුය. මීට අදාළ කටයුතු සිදුකිරීම සඳහා අධිකාරිය විසින් මෙතෙක් ක්‍රියාකර නොතිබුණි.	පනතේ 43 වන වගන්තිය පරිදි අදාල ගැසට් පත්‍රය 2336/46 දරණ අංකය යටතේ 2023.06.14 දින පළ කරන ලද අතර, 2023.10.05 දින පළ කරන ලද පුවත්පත් දැන්වීමක් මඟින් සැපයුම්කරුවන් ලියාපදිංචිවීමේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කරන ලදී. තවද සුදුසුකම් ලත් සැපයුම්කරුවන් සඳහා ඇතුළත් වීමේ ක්‍රියාවලිය සරල කරමින් පරිශීලක-හිතකාමී ලියාපදිංචි අයදුම්පතක් මුලපිරීම සමඟ ක්‍රියාත්මක කරන ලදී. අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය සම්බන්ධ මාර්ගෝපදේශකය මුද්‍රණය කරන ලදී. මූලික ද්‍රව්‍ය ලැයිස්තුව සකසා අවසන් කර ඇත.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.
(iii)	පනතේ 51(2) වගන්තිය පරිදි කාර්මික ආරවුල් තීරනකරණ ක්‍රියාපටිපාටිය නියම කළ යුතු වුවද අධිකාරිය විසින් මේ දක්වා ආරවුල් තීරනකරණයට අදාල ක්‍රියාපටිපාටි සකස්කර නොතිබුණි.	තීරකකරණය (Adjudication) පිලිබඳ ක්‍රියාපටිපාටිය සකස් කර ඇති අතර 28/11/2017 දින අමාත්‍යාංශයට හා නීති කෙටුම්පත් සම්පාදක වෙත ප්‍රථමවරට ඉදිරිපත් කර ඇත.දැනට වරින් වර සංශෝධන ඉදිරිපත් කරමින් පවතී.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.

(iv)	පනතේ X වන කොටසෙහි 53 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි අමාත්‍යවරයා විසින් අධිකාරියේ නිර්දේශ මත පත්කරනු ලබන 7දෙනකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකින් සමන්විත අභියාචන මණ්ඩලයක් පිහිටුවිය යුතුය. අභියාචන මණ්ඩලයේ සියළු සාමාජිකයින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වසර 20 කට නොඅඩු පළපුරුද්දක් සහිත තැනැත්තන් විය යුතුය. මේ දක්වා මෙම අභියාචන මණ්ඩලය පත්කර නොතිබුණි.	මේ සඳහා අමාත්‍යතුමාගේ අනුමැතිය මේ දක්වා ලබා දී නොමැති බැවින් මෙම මණ්ඩලය පත්කිරීමට නොහැකි විය.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.
(v)	පනතේ XI වන කොටසෙහි 55 වන වගන්තියට අනුව පනතේ දක්වා ඇති තොරතුරු අවශ්‍ය පාර්ශවයන් වෙනුවෙන් තොරතුරු ලබාදීම සඳහා තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර එහි කර්තව්‍ය හා කාර්යය පටිපාටි සහ කාර්යය සාධන ප්‍රමිති නියම කරනු ලැබිය යුතුය. එසේ වුවද අධිකාරිය විසින් තොරතුරු පද්ධතියක් මෙතෙක් සංවර්ධනය කර නොතිබුණි.	තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා 2023.07.26 ආරම්භ කරන ලදී. එමෙන්ම එයට අදාලව ඉදිකිරීම් වැඩ සම්බන්ධ වාර්තා හා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් නියාමනය කිරීම සඳහා අදාල වන වාර්තා ද සකසාගෙන යමින් පවතී.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.
(vi)	පනතේ III වන කොටසේ 13 වන වගන්තිය පරිදි අධිකාරියේ කර්තව්‍යයන් යටතේ දක්වා ඇති මෙම කාර්යයන් මෙතෙක් සිදුකර නොතිබුණි. රටේ දැනට තිබෙන නිශ්චිතව සඳහන් කරනු ලබන බර ඉදිකිරීම් පිරියත, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධ නාමාවලියක් පවත්වාගෙන යාම, වෙනත් රටවල ඉදිකිරීම් කටයුතු භාරගනු ලබන දේශීය වශයෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම හා සුහසාධනය, පරිසර හිතකාමී, යෝග්‍ය, පිරිවැය කාර්යක්ෂම සහ දැරියහැකි නව තාක්ෂණයන් යොදා ගැනීම සහ ව්‍යාප්ත කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම, ඉදිකිරීම් කර්මාන්තයේ යම් ද්‍රව්‍ය, පිරියත සහ යන්ත්‍රෝපකරණ අවශ්‍යතා සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සහ ඉදිකිරීම් වැඩ වලදී දේශීය නිෂ්පාදනය සංවර්ධනය කිරීම හා භාවිතයට ගැනීම දිරිමත් කිරීම, ඉදිකිරීම් කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ භාරගැනීම.	බර ඉදිකිරීම් යන්ත්‍ර සහ උපකරණ නාමාවලියක් පවත්වා ගෙන යාම සම්බන්ධව 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (වගන්තිය අංක 44) ප්‍රකාරව ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ පිලිබඳ දත්ත ගබඩාවක්/ලේඛනයක් පවත්වාගෙන යාමට අවස්ථාව සලසා ඇත. එවැනි යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලියාපදිංචි කිරීමේ නීති 2019 මාර්තු 28 දිනැති අංක 2116/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති අතර මහජන පරිශීලනය සඳහා අධිකාරිය වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කර ඇති මෙම විද්‍යුත් නාමාවලිය යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදුවෙමින් පවතී.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.

(vii)	පනතේ VIII වන කොටසේ 46 වගන්තිය පරිදි අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛණ (Standard Biding Documents) පිළියෙල කළ යුතුය. තවද, 2014 වර්ෂයේ දී ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය 2014 අංක 33 දරණ පනත මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බවට පත්ව තිබුණි. නමුත් පෙර පිළියෙළ කර තිබුණු ලංසු ලේඛන ප්‍රසම්පාදන වැඩ (SBD – 01) හා ප්‍රසම්පාදන වැඩ සුළු (SBD – 03) කාලීනව අධිකාරියක් බවට පත්වීමත් සමඟ මෙතෙක් සංශෝධනය කර නොතිබුණි. තවද සම්මත ලංසු ලේඛණ 02 (ප්‍රසම්පාදන - වැඩ - Major – SBD-02) හා SBD-04 (Design and Build) යාවත්කාලීන කිරීමට අදාළ වැඩ කටයුතු සිදුකර තිබුණද ඒ අනුව මෙම සම්මත ලංසු ලේඛන 2021 ජූලි 27 දින භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. පසුව 2023 ඔක්තෝබර් 03 දින ප්‍රසිද්ධ දැන්වීමක් මගින් පරීක්ෂණ මට්ටමින් වසරක කාලයක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව වසර 2 කට අධික කාලයක් මෙම ප්‍රමිත ලේඛන ක්‍රියාත්මක වීම නිශ්චිත හේතුවකින් තොරව ප්‍රමාද වී පැවතුණි. උපදේශණ සේවා සම්බන්ධ ප්‍රමිති ලේඛන (Standard Biding Documents for Consultancy) අවසන් වරට පිළියෙල කර තිබුණේ 2002 අගෝස්තු මස වන අතර එම දින සිට විගණිත දින දක්වා මෙම ලේඛන යාවත්කාලීන කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.	2024 උක්ත ලේඛන අදාල සංශෝධනයන් සිදු කොට නිසි ක්‍රියාපටිපාටියක් තුලින් කර්මාන්තයට නිදහස් කිරීමට බලාපොරොත්තු වේ.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ශිල්පීය පුහුණු වැඩසටහන සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු මුදල් වලින් ගිණුම් වර්ෂය ආරම්භ වන විට රු.මිලියන 48.29 ක ශේෂයක් පැවතුණි. ගිණුම් වර්ෂය අවසානයේදී රු.මිලියන 13.15 ක ශේෂයක් ඉතිරිව පැවතුණි. ඒ අනුව ගිණුම් වර්ෂය තුළදී රු.මිලියන 35.15 ක් වැයකර තිබුණු අතර ඉන් රු.මිලියන 13.25 ක් ගෙවිය යුතු පුහුණු පාඨමාලා දීමනාලෙස ගෙවීම් සිදුකර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය	මෙම වැඩසටහන සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වැය කිරීමේදී අනුමත වියදම් කාණ්ඩ යටතේ නිසි පරිදි ඉටුකොට ඇත. කෙසේ වෙතත් මෙම වැඩසටහන රටේ පැවති දුෂ්කර තත්ත්වයන් හමුවේ ප්‍රමාදවී අවසන් වූ බැවින් ඊට අදාල පරිපාලන හා අධීක්ෂණ කටයුතු ප්‍රමාද වී පැවති බැවින් ඊට අදාල වියදම් මෙම කාල සීමාවේදී වැඩිවශයෙන් සිදුවී ඇත. කෙසේ වෙතත් මෙම වැඩසටහනේ	අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට හෝ ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.

	තුළදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර පුහුණු අංශයේ පරිපාලන වියදම් සඳහා රු.මිලියන 21.89 ක් දරා තිබුණි.	කටයුතු මේ වන විට අවසන් අදියරට පැමිණ ඇත.	
(උ)	ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 35.7 ක මුදලක් ලබා දී තිබුණි. මීට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපනය සඳහා 2022 මාර්තු 11 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත රු. මිලියන 3.35 ක කොන්ත්‍රාත්තුවක් පවරා තිබුණි. මීට අදාළ පද්ධති සංවර්ධන කටයුතු දින 21 ක් තුළ සම්පූර්ණ කළ යුතු වුවද 2024 අප්‍රේල් 30 දින දක්වා අවසන් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද නිපුණ ශිල්පීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට පෙර ඊට අදාළ රීති හා ගාස්තු ගැසට් පත්‍රයේ පළකර ඉන් පසුව අදාළ ගාස්තු අයකර ගැනීම නෛතික තත්ත්වය වුවද අධිකාරිය විසින් මේ දක්වා ඊට අදාළ රීති හා ගාස්තු ගැසට් කිරීමකින් තොරව මේ සඳහා අයදුම්පත් කැඳවා ඔවුන්ගෙන් ගාස්තු අයකර තිබුණි. මෙසේ ගාස්තු අයකර 2023 ජූලි 31 දින වන විට හැඳුනුම්පත් 228 ක් නිකුත්කර තිබුණි.	තොරතුරු තාක්ෂණික පද්ධතිය සකස් කොට අවසන් වී ඇති අතර එය ප්‍රායෝගිකව අත්හදා බැලීමේ කටයුතු සහ එහිදී පැන නගින ගැටළු සඳහා අවශ්‍යවන නිවැරදි කිරීම් මේ වන විට සිදුවෙමින් පවතියි. එම නිවැරදි කිරීම් වලින් අනතුරුව ඉදිරි සති දෙක තුලදී මෙම පද්ධතිය මුළුමනින්ම CIDA ආයතනය වෙත භාර දෙන බව දන්වා ඇත.	නිපුණ ශිල්පීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අදාළ රීති හා ගාස්තු ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	බත්තරමුල්ල නිවාස සැළසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානයෙහි පාඨමාලා හදාරන සිසුන්ගේ නේවාසික පහසුකම් සඳහා කාමර 8 කින් යුක්ත නේවාසිකාගාරයක් පවතී. මෙම නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් උපයෝජනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	මෙම නේවාසිකාගාරයේ ප්‍රධාන අරමුණ පුහුණු පාඨමාලා සඳහා දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණෙන සිසුන්ගේ නේවාසික පහසුකම් ලබාදීම වුවද එම ප්‍රධාන අරමුණට පටහැනිව අධිකාරියේ	ඉහත සඳහන් පරිදිම සිසුන්ට බාධාවක් නොවන පරිදි CHPB ආයතනය ආසන්නයේ පිහිටා ඇති අපගේ අනුබද්ධ ආයතනයක් වන CETRAC ආයතනයේ නවාතැන් පහසුකම් ලබා	නේවාසික පහසුකම් පුහුණුව ලබන සිසුන් සඳහා ලබා දීමට කටයුතු කළ යුතුය.

	කාර්යය මණ්ඩලයට හා රේඛීය අමාත්‍යාංශයේ සේවක නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම් ලබාදී තිබුණි.	දීමට කටයුතු කර ඇත.	
(ii)	නේවාසිකාගාරයේ එක් කාමරයක සිසුන් හතර දෙනකු සඳහා සාමාන්‍ය පරිදි නේවාසික කටයුතු සඳහා ප්‍රමාණවත් වුවද වෙන්කර ඇති ඇතැම් කාමරවල සිසුන් 10 දෙනෙකු හා 11 දෙනකු ආදී වශයෙන් නේවාසික පහසුකම් ලබාදී තිබුණි. ඒ තුළින් සිසුන්ට අධ්‍යාපන කටයුතු සඳහා සුදුසු පරිසරයක් නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.	ඉහත සඳහන් පරිදිම සිසුන්ට බාධාවක් නොවන පරිදි CHPB ආයතනය ආසන්නයේ පිහිටා ඇති අපගේ අනුබද්ධ ආයතනයක් වන CETRAC ආයතනයේ නවාතැන් පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.	සිසුන් සඳහා ප්‍රමාණවත් කාමර පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතුය.
(iii)	නේවාසික පහසුකම් ලබා ගන්නා නිළධාරීන්ගෙන් රු. 5,000 ක් අයකිරීමට තීරණය කර තිබුණු අතර මෙම මුදල පවත්නා වියදම් විශ්ලේෂණයේ දී ආර්ථික කුලියක් නොවන බවට හා අමාත්‍යාංශ නිලධාරීන් තිදෙනාගෙන් එම මුදල් අයවී නොමැති බවටත් විගණනයේ දී නිරීක්ෂණය විය.	CIDA ආයතනයේ හා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය වෙත ලබා දී ඇති කාමර සඳහා එක් අයෙකුගෙන් රු.5000/-ක මාසික කුලියක් අයකර ගැනීමට 2023.06.19 වන දිනැති මෙමෝ පත මගින් අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය හා සභාපතිගේ අනුමැතිය අනුව තීරණය කර ඇත.	කුලී අයකරනු ලබන අවස්ථාවලදී ආර්ථිකමය වශයෙන් ප්‍රමාණවත් කුලියක් අය කළ යුතුය.

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වහලය අළුත්වැඩියාව		
(i)	අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වහලය අළුත්වැඩියාව සඳහා රු.මිලියන 5.59 ක සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙළ කර තිබුණු අතර එම ඇස්තමේන්තුව ඊට අදාළ වගකිව යුතු ඉංජිනේරුවරයකු අනුමත කර නොතිබුණි. මෙම කාර්යයට අදාළව ඉටුකළ යුතු කාර්යයන් නිශ්චිතව හඳුනාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන නිසි අධීක්ෂණයකින් යුතුව ඉටුකරවා ගැනීමට ක්‍රියාකර නොතිබීම හේතුවෙන් වහලයෙහි ස්ථාන කිහිපයක ජලය කාන්දු වීම සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	මෙම අලුත්වැඩියා කටයුතු වලට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීමේ කටයුතු ඉංජිනේරුවරුන් වෙතින් සිදු කර ගැනීමට නොහැකි වූ බැවින් මෙම අලුත්වැඩියාවේ අධීක්ෂණ කටයුතු ආයතනයේ සේවය කරන වෙනත් වඩාත් සුදුසුකම් සහිත ඉංජිනේරු සහකාර (සිවිල්) නිලධාරිණියක් වෙතින් ඉටුකර ගැනීමට සිදුවිය. අලුත්වැඩියාවෙන් පසු ස්ථාන කිහිපයකදීම ජලය කාන්දු වීම සිදු වූ බැවින් නැවත ඔහුට මේ බව දැනුම් දී මේ වනවිට යථාතත්වයට පත්කර ඇති අතර ඉන්පසුව පැවති අධික වර්ෂාව නිසා නැවත ස්ථාන කිහිපයකින් ජලය කාන්දු වන බැවින් එම ස්ථාන ද නැවත	අනුමත ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙළ කර ඒ අනුව මිල ගණන් කැඳවීමටත්, සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමටත් කටයුතු කළ යුතුය.

		අලුත්වැඩියා කරන ලෙස මේ වනවිට එම ආයතනයට ලිඛිතව දැනුම් දී ඇත.	
(ii)	2022 අගොස්තු 23 දින පස්වරු 2.00ට ලංසු විවෘත කිරීම් කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 අනුව ලංසු විවෘත කිරීමේ වේලාව, ස්ථානය ආදියට අමතරව (ආදල වන පරිදි) ලංසුකරු නිවේදිත මිළ ගණන්, ලංසු සුරක්ෂණ සහතික ඇති නැති බව සහ ඉදිරිපත් කරනු ලැබ ඇති ලංසුවල සඳහන් වෙනත් විශේෂ ලක්ෂණ කිසිවක් වෙතොත් ඒවා ලංසු විවෘත කිරීමේ සටහන්වල ඇතුලත් කළ යුතු වුවත් ඒ පිළිබඳ නිරීක්ෂණ ලංසු විවෘත කිරීමේ සටහන් තුළ (minutes) නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි.	ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේදි ලංසු ලේඛන සම්පූර්ණ කළයුතු බවට පිළිගන්නා නීතියක් වුවද මෙම කටයුත්ත අභ්‍යන්තර විගණන ඒකකය/ මුදල් අංශය සහ සැපයුම් අංශය නියෝජනය වන පරිදි නිලධාරින් කණ්ඩායමක් විසින් ලංසු විවෘත කර පරික්ෂා කර බලා ලංසු විවෘත කිරීමේ ලේඛනයේ අත්සන් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 අනුව ලංසු විවෘත කිරීමේ සටහන් සම්පූර්ණ කළ යුතුය.
(iii)	රු.මිලියන 5.59 ට සකස් කළ ඉංජිනේරු ඇස්තමේන්තුවේ දක්වා තිබූ ඉදිරිපස ආලින්දයේ වැඩ අයිතමයන් තුළ වූ ඩී 6, ඩී 7 සහ ඩී 8 යන රු.මිලියන 1.32 ක අයිතම 3 ක් ඉවත් කර කොන්ත්‍රත්කරු විසින් රු.මිලියන 5.59 ක මිලට එකඟ වී ඇති බව නිරීක්ෂණය විය.	මූල්‍ය ප්‍රතිපාදන කළමණාකරනය කර ගැනීමේ අවශ්‍යතාවය මත ඩී 6, ඩී 7 සහ ඩී 8 යන අයිතම ඉවත් කරන ලදි.	ඉංජිනේරු ඇස්තමේන්තුව සහ සැලැස්මට අනුව වැඩ අයිතමයන් සිදු කර කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ යුතුය.
(iv)	අධිකාරිය පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු එකඟ වූ මිල ගණන් හා සැසඳීමේදි කොන්ත්‍රාත්කරු විසින් වැඩ අයිතමයන් 13 ක් සඳහා සියයට 20 සිට සියයට 474 දක්වා මිල රේටයන් වැඩියෙන් දක්වා තිබුණි.	ලංසු ඇගයීමේදි එකම කොන්ත්‍රාත්කරුවෙකු පමණක් සිටි නිසා අයිතමයෙන් අයිතමය මිල ගණන් විශ්ලේෂණය කිරීමක් සිදු නොකරන ලද අතර මූලික ඇස්තමේන්තුවෙන් වැඩ නිමකළ හැකි ප්‍රමාණයට අඩු කිරීම පමණක් කරන ලදි.	ඇස්තමේන්තුගත මිල ගණන් සහ කොන්ත්‍රාත්කරු එකඟ වූ මිල රේටයන්ගේ අසාමාන්‍ය තත්ත්වයන් විශ්ලේෂණය කළ යුතුය.
(v)	අධිකාරිය පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු එකඟ වූ ඒකක ගණන් හා සැසඳීමේදි වැඩ අයිතමයන් 4 ක ඒකක ප්‍රමාණයන් අඩුවෙන් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය.	පවතින මූල්‍ය ප්‍රතිපාදන මත කළමණාකරනය කර ගැනීමේ අවශ්‍යතාවය මත සමහර අයිතමවල වැඩ ප්‍රමාණය අඩු කිරීමට සිදු විය.	ඇස්තමේන්තුව අනුව වැඩ අයිතමයන්ගේ ඒකක ප්‍රමාණයන් සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත්කරු මඟින් ඉටු කර ගත යුතුය.

(vi)	කොන්ත්‍රාත්කරු විසින් මුලින් එකඟ වූ මිල ගණන් සහ කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිම කළ පසු ඉදිරිපත් කළ 3 වන බිල්පත හා සැසඳීමේදී මෙම අලුත්වැඩියාව නිම කිරීමට මුලින් එකඟ වූ ඒකක ප්‍රමාණයට වඩා සත්‍ය ඒකක ප්‍රමාණය අඩුවෙන් කර ඇති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු එකඟ වී තිබූ එක් එක් වැඩ අයිතමයන්ගේ නිම කළ සත්‍ය ඒකක ප්‍රමාණයන් අතර සියයට 5 සිට සියයට 97 දක්වා පරාසයක අඩුවෙන් වැඩ කොටස් නිම කර තිබුණු අතර අයිතම 4කට අදාළ වැඩ කොටස් සම්පූර්ණයෙන්ම සිදු කර නොතිබුණි.	අලුත්වැඩියා කටයුත්තක් බැවින් අවශ්‍යතාවය මත ප්‍රමාණයන්ගේ වෙනස්වීම් සහ විචලනයන් සිදු විය හැක. තවද, මෙය මැන ගෙවීමේ (Measure & Pay) කොන්ත්‍රාත්තුවකි.	නිවැරදි ඇස්තමේන්තුවක් අනුව වැඩ අයිතමවල ඒකක ප්‍රමාණයන් සිදු කිරීමටත්, සියළුම වැඩ අයිතමයන් සම්පූර්ණ කර ගැනීමටත් ඉදිරියේදි කටයුතු කළ යුතුය.
(vii)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (අ) සහ (ආ) අනුව අතුරු ගෙවීම් සහ අවසාන ගෙවීම් කිරීමේ කාර්යය සඳහා වැඩ ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ සැපයීම හෝ සේවා සැළසීම ප්‍රමාණවත් පරිදි අධික්ෂණය කරන බවටත්, තක්සේරු කරන බවටත්, සහතික වීම සඳහා අධිකාරියේ සුදුසුකම්ලත් නිළධාරියෙකුගේ අධික්ෂණයකින් තොරව මෙම අලුත්වැඩියා කිරීම් සිදු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.	අලුත්වැඩියා කටයුත්තට අදාලව සියලුම සැපයුම් හා අලුත්වැඩියා කටයුතු පරික්ෂා කිරීම නඩත්තු කටයුතු භාරව සිටි පරිපාලන නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සහ නඩත්තු සහායකගේ සහභාගිත්වයෙන් ඉටු කර ගන්නා ලදී.	සුදුසුකම්ලත් නිළධාරියෙකුගේ අධීක්ෂණය මඟින් වැඩ සිදු කර ගත යුතුය.
(viii)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 (අ) සහ (ආ) අනුව වැඩ සඳහා පිරිවිතර සහ එකඟවී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටු කර ඇති බව, සහ සහතික කර ඇති ගෙවීම්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල බව සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා/ උපදේශකවරයා විසින් නිකුත් කළ යුතු බව දක්වා තිබුණද එවැනි සහතික කිරීමක් මෙම අලුත්වැඩියාව සඳහා නොතිබුණි.	වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන්නේ දෝෂ නිවැරදි කිරීමේ කාලසීමාව (Defects Liability Period) අවසන් කිරීමෙන් පසුවය.	වැඩ අවසන් කිරීමේ සහතිකයක් මෙම අලුත්වැඩියාව සඳහා ලබා ගත යුතුය.
(ආ)	අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි "සව්සිරිපාය" ගොඩනැගිල්ලේ නම් කරන ලද බිත්ති දළඹ/ බීම්/ කණු පලුදු මකා තද වර්ණ ඉවත්කර තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය තීන්ත	තීන්ත මිලදී ගැනීමේදි තීන්ත ලබා දෙන වෙළඳසැල් ණයට (Credit) ලබා නොදෙන බැවින් මෙය ඉතා හදිසි බැවින් ඒ සඳහා ණයට සැපයිය හැකි ආයතන සමඟ කතා කර ඒ අනුව (Hand	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු බව.

ද්‍රව්‍ය මිලදී ගැනීම 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ආ) අනුව නියමිත ප්‍රමිතීන්ට, පිරිවිතරවලට, රීතිවලට, රෙගුලාසිවලට සහ යහපත් පාලනයට අනුකූලව කටයුතු කිරීම, 1.2.1 (ඇ) අනුව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම, 1.2.1 (ඊ) අනුව ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතිකවීම සහ 1.2.1 (උ) අනුව ලංසුකරුවන් විසින් සපයනු ලබන තොරතුරුවල රහස්‍යභාවය රැකගැනීම යන ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික විය යුතු මූලික අරමුණු ඉටුවන ආකාරයට සහ 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4 අනුව ප්‍රසම්පාදන ආචාර ධර්ම ඉටුවන ආකාරයට අධිකාරිය විසින් මෙම තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය තීන්ත ද්‍රව්‍ය මිලදී ගැනීමේ හා තීන්ත ආලේප කිරීමේ කටයුතුවලට අදාළ ප්‍රසම්පාදනය ක්‍රියාවලිය සිදු කර නොතිබුණි.	Quotation) අතින් ලද මිල ගණන් ලබාගෙන ඇත.	

3.3 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 3.5 හා 6.8 වගන්තිවලට පටහැනිව අධිකාරිය සතු අංක 65-7300 දරණ වාහනය 2023 ජූලි 20 දින සිට රියදුරු සමග අමාත්‍යාංශයේ කටයුතු සඳහා මුදාහැර තිබුණු අතර, රියදුරු වැටුප්, දීමනා හා අතිකාල වශයෙන් ගෙවා තිබුණු මුදල්, අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතුකර නොතිබුණි. මීට අමතරව අධිකාරියේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රියාකරු තනතුරේ සේවකයකු 2007 මැයි මාසයේ සිට අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයට මුදාහැර තිබුණු අතර ඔහුට ගෙවා තිබුණු වැටුප්, දීමනා අතිකාල නැවත	රියදුරුගේ ගමන් වියදම් හා යැපීම් දීමනා සහ අතිකාල දීමනා අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කර දෙන ලෙස සිහිකැඳවීම් ලිපි යවා ඇත. ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පීවරයා නැවත මෙම අධිකාරිය වෙත නිදහස් කරන ලෙස අංක 1/4/107–VI (886) දරණ 2020.08.28 හා 2020.12.15 දිනැති ලිපි මගින් රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත සිදුකර ඇති ඉල්ලීම සඳහා පිලිතුරු වශයෙන් එවා ඇති රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2/1/7A/826 (ii) හා 2021.03.30 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත්තේ ඔහුව නැවත අප ආයතනය වෙත මුදා හැරීමට අපහසු බවයි.	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූල විය යුතුය.

	අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.		
(ආ)	අධිකාරිය විසින් 57-9385 දරණ ජීප් රථය 2023 ඔක්තෝබර් 08 දින සිට නොවැම්බර් 05 දක්වා අමාත්‍යවරයාගේ කටයුතු සඳහා මුදාහැරීම තුළින් රු.110,268 ක මුදලක් ඉන්ධන සඳහාද රු.17,830 ක් අතිකාල සඳහාද වැයකර තිබුණි. මෙම වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම වාහනය නිදහස් කිරීම් සඳහා නිසි අනුමැතියක් ද නොතිබුණි.	ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් CIDA ආයතනයේ සභාපති වෙත එවන ලද ලිඛිත ඉල්ලීමක් අනුව අධිකාරියේ සභාපතිතුමා විසින් ලබා දී ඇති අනුමැතිය මත මෙම වාහනය නිදහස් කර ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සම්පත් වෙනත් පාර්ශවයන් වෙත මුදා නොහැරිය යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 හා 2022 වර්ෂවල අධිකාරියේ මානව සම්පත් කළමනාකරණයේ කැපී පෙනෙන ගැටළුකාරී තත්ත්වයන් පැවතීම හේතුවෙන් නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම්, අනිවාර්ය නිවාඩු යැවීම්, ඉල්ලා අස්වීම්, අධිකාරියට විරුද්ධව නඩු පැවරීම්, වන්දි ගෙවීම් හේතුවෙන් නීති වියදම රු.මිලියන 7.78 ක් දක්වා සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ධනය වී තිබුණි.තවද හිටපු මුදල් අධ්‍යක්ෂ විසින් හිටපු සභාපතිට විරුද්ධව පෞද්ගලිකව ගොනුකර තිබුණු අපහාස නඩුව (DMR/3067/2022 දරණ නඩුව) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව රු.මිලියන 0.33 ක නීතිඥ ගාස්තු මේ වන විට ගෙවා තිබුණි. මෙම නඩුව අධිකාරියට සම්බන්ධයක් නොමැති පුද්ගලික නඩු කටයුත්තක් බැවින් මු.රෙ 156(i) (අ), (ආ) හා (7) වගන්තිය ප්‍රකාරව මෙම මුදල් අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පෞද්ගලික වන්දි නඩුවට අදාළව අධිකාරිය විසින් දරා ඇති වියදම් සම්බන්ධයෙන් 2024.05.29 වන දින පැවැත්වෙන කළමනාකරණ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර එහි දී ලැබෙන තීරණ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා වූ අධිකාරියේ වාර්ෂික වාර්තාව මේ දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණු අතර 2023 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මේ දක්වා විගණනය වෙත ඉදිරිපත් නොවිය.	2022 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් යොමුකර ඇති අතර 2023 වාර්ෂික වාර්තාව සකස් කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය සඳහා 2024 මැයි මස 29 දින පැවැත්වෙන එහි රැස්වීමට යොමුකිරීමට කටයුතු යොදා ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට අදාළ ප්‍රගතිය පරීක්ෂාවේ දී පහත එක් එක් කාර්යයන්හි කාර්යසාධනය පහළ මට්ටමක පැවතුනි. එනම්, දේපළ සංවර්ධනකරුවන් ලියාපදිංචිය, ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නන් ලියාපදිංචිය, සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචිය, ආරවුල් තීරණකරණය පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම, හරිත ගොඩනැගිලි සපයන්නන් ලියාපදිංචිය, වැඩබිම් සුපරීක්ෂකවරුන් හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් ලියාපදිංචිය යනාදිය වේ. තවද, විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය, තාක්ෂණික විගණනයන් සිදු කිරීම, සියලු දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ඩිජිටල්කරණය කරන ලද දත්ත පද්ධතියේ නිපුණ ශිල්පීන් ලියාපදිංචි කිරීම, සුපරීක්ෂන මට්ටමේ කළමනාකරුවන් සහ වෘත්තීය මට්ටමේ වෙනත් නිලධාරීන් පුහුණු කිරීම, ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන්, ඉදිකිරීම් උපකරණ පිළිබඳව තරුණයින් පුහුණු කිරීම යන කාර්යයන් හි කාර්යය සාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	දේපල සංවර්ධනකරුවන් ලියාපදිංචිය සඳහා අදාළ ගැසට් පත්‍රය 2020.05.25 වන දින අංක 2181/21 නිකුත් කරන ලදී. ලියාපදිංචිය අනිවාර්ය කිරීමට නීති සම්පාදනය සඳහා කටයුතු කරමින් තිබේ. හරිත ගොඩනැගිලි ද්‍රව්‍ය ශ්‍රේණිගත කිරීමේ වැඩසටහනට අදාලව මාර්ගෝපදේශ, අයදුම්පත්‍ර ආදිය සකස් කොට ඇත. විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2018.08.23 දින නිකුත් වූ අංක 2085/19 දරණ ගැසට් පත්‍රය අනුව දැනට කරගෙන යනු ලැබේ. ඉදිකිරීම් අමුද්‍රව්‍ය ලියාපදිංචිවීමේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම, ඇතුළත් වීමේ ක්‍රියාවලිය සරල කරමින් පරිශීලක - හිතකාමී ලියාපදිංචි අයදුම්පතක් මුලපිරීම, ලියාපදිංචිය සම්බන්ධ මාර්ගෝපදේශකය මුද්‍රණය කිරීම, මූලික ද්‍රව්‍ය ලැයිස්තුව සකසා අවසන් කර ඇත.	ක්‍රියාකාරී සැළැස්මට අනුව කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.